**<u>මහජනතාව වෙත කෙරෙන දැනුම් දීමයි</u>**

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ප්‍රතිස්ථාපනය කර නව ත්‍රස්තවිරෝධී පනතක් කෙටුම්පත් කිරීම සඳහා නිර්දේශ/ අදහස්/ යෝජනා ලබා ගැනීම.**

දැනට ලංකාවේ බලපැවැත්වෙන 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ හිදැස් හඳුනා ගනිමින් එම පනත පරිච්ඡින්න කර නව නීතියක් කෙටුම්පත් කිරීමට ලද කැබිනට් අනුමැතිය මත අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා  අමාත්‍යතුමා විසින් පත්කල විද්වත් කමිටුවක් මඟින් ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීමට කටයුතු කරමින් පවතී.

නව පනතක් හඳුන්වා දීම තුලින් නූතන ගෝලීය ත්‍රස්තවාදී අභියෝගයන්ට මුහුණු දීම, දේශීය සහ විදේශීය වශයෙන් පුද්ගලයන්ගේ මානව හිමිකම් සහ අන්තර්ජාතිකව පිලිගන්නා වූ ප්‍රමිතීන්ට අනුගත වීම අදහස් කරනු ලැබේ.

ඒ අනුව 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත පරිච්ඡින්න කර නව ත්‍රස්තවිරෝධී පනතක් කෙටුම්පත් කිරීම සඳහා ඔබගේ අදහස්, නිර්දේශ, යෝජනා ඇත්නම් මෙම දැන්වීම පළ වූ දින සිට දින 14ක් ඇතුළත ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා  අමාත්‍යාංශය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

එම තොරතුරු ඉදිරිපත් කිරීමේදී ලියුම් කවරයේ වම් කෙළවරේ "ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත සඳහා යෝජනා" යනුවෙන් සඳහන් කොට පහත ලිපිනය වෙත යොමු කිරීමට හෝ එසේ නොමැති නම් legal@moj.gov.lk විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලේකම්**
**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා  අමාත්‍යාංශය,**
**නො. 19,**
**ශ්‍රී සංඝරාජ මාවත,**
**කොළඹ 10.**

ලේකම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා  අමාත්‍යාංශය